රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2026

මගේ අංකය : EST-3/04/POL/0072
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.07.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට ඉදිරිපත් වීම සඳහා නාමයෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට ජීවන වියදම් දීමනාව ගෙවීම**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමට නාමයෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට සහන සලසමින් නිකුත් කරන ලද 2023.04.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2023 හා 2025.09.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2025 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ විධිවිධාන පරිදි මූලික වැටුප ගෙවන ලද නිලධරයන්ට, මූලික වැටුප ගෙවන ලද කාලයට අදාළව ජීවන වියදම් දීමනාව ද ගෙවීමට 2026.06.15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ඒ අනුව, එම නිලධරයන්ට ගෙවන ලද මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ද ගෙවීමට කටයුතු කළ යුතුය.

03. මෙම විධිවිධාන 2023 මාර්තු මස 09 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට පමණක් අදාළ වේ.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 0112-692159
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ad-3-est@pubad.gov.lk